# මුදල් කොමිෂන් සභාවේ කාර්තුමය කාර්ය සාධන වාර්තාව

(2019 ජුලි 01 වන දින සිට 2019 සැප්තැම්බර් 30 වන දින දක්වා)

## 1. පළාත් සභා සඳහා වියදම් අවශ්‍යතා තක්සේරු කිරීම (පුනරාවර්තන හා ප්‍රාග්ධන)

මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව පළාත් සභා විසින් 2020 මුදල් වර්ෂය සඳහා ජාතික අයවැය ප්‍රදාන යටතේ පුනරාවර්තන හා ප්‍රාග්ධන අයවැය අවශ්‍යතා ඉදිරිපත් කරන ලදී.

පළාත් සභා විසින් මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද පළාත් පුනරාවර්තන අවශ්‍යතා පිලිබඳව අදාළ පළාත් අයවැය මෙහෙයුම් නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීම් හා අවශ්‍ය පැහැදිලි කර ගැනීම් කරමින් සමාලෝචනය කරන ලදී. පුනරාවර්තන අයවැය තක්සේරු කිරීම සඳහා ප්‍රධාන රේඛීය අමාත්‍යාංශවල සේවක සංඛ්‍යා යෙදවීමේ සැලසුම් සහ අදාළ මූල්‍ය අවශ්‍යතා පිළිබඳ තොරතුරු ද එක්රැස් කර සලකා බලන ලදී. මීට අමතරව, මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභා නිලධාරීන්ගේ (නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - මූල්‍ය) හා (අධ්‍යක්ෂ - අයවැය) සහ මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් රැස්වීම් සංවිධානය කර පළාත් සභා වල පුනරාවර්තන අවශ්‍යතා සමාලෝචනය කර, 2020 වර්ෂය සඳහා වූ පළාත් සාමූහික ප්‍රදාන අවශ්‍යතාවය ඉදිරිපත් කරන ලදී.

සියලුම පළාත් සභා මුදල් කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද මාර්ගෝපදේශයට අනුකූලව සහ අදාළ පළාත් සභාවල මධ්‍ය කාලීන සංවර්ධන සැලසුම් රාමුව තුළ ජාතික අයවැයෙන් අපේක්ෂිත ප්‍රාග්ධන ප්‍රදාන අවශ්‍යතාව ඉදිරිපත් කරන ලදී. මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභා ඉදිරිපත් කරන ලද ප්‍රාග්ධන අවශ්‍යතා අධ්‍යයනය කළ අතර පළාත් ලේකම්වරුන්ගේ සහ පළාත් අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වයෙන් අවශ්‍ය අංශ වලට අදාළ රැස්වීම් පවත්වන ලදී. පළාත් ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා තක්සේරු කිරීම අරමුණ කර ගනිමින් පළාත් අමාත්‍යංශ ලේකම්වරුන්ගේ හා අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වයෙන් පුළුල් සාකච්ඡාවක් පැවැත්වීමෙන් අනතුරුව එක් එක් පළාත් සඳහා ප්‍රාග්ධන වියදම් අවශ්‍යතාවය නිගමනය කරන ලදී.

## 2. අතිගරු ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම - 2020

ප්‍රාග්ධන සහ පුනරාවර්තන අවශ්‍යතා පිළිබඳව පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද අයවැය අවශ්‍යතා මත පදනම්ව, මුදල් කොමිෂන් සභාව විසින් 2020 වර්ෂය සඳහා සකස් කරන ලද නිර්දේශ 2019.09.09 දින අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී. 2020 අයවැය නිර්දේශ සඳහා පදනම වූයේ ජාතික අයවැය යටතේ තාර්කික ලෙස අරමුදල් බෙදීමේ මූලධර්මය මත පළාත් සභාවලට අරමුදල් වෙන් කිරීමයි.

රටෙහි තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමේදී කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇති ප්‍රධාන ගැටළු මඟහරවා ගැනීම සඳහා වන සීමාවන් සහ වැදගත් ප්‍රතිපත්තිමය නිර්දේශයන් ද මුදල් කොමිෂන් සභාවේ 2020 නිර්දේශ තුල ඉස්මතු කරන ලදී.

## 3. 2019 වර්ෂය සඳහා පළාත් සභා පරිපූරක අයවැය ප්‍රතිපාදන ලබා දීම (පුනරාවර්තන)

තුන්වන කාර්තුවේදී පළාත් සභා හයක් විසින් පුනරාවර්තන වියදම් සඳහා ඉල්ලුම් කරන ලද පරිපූරක අයවැය ප්‍රතිපාදන මුදල රු.මි 4 084 ක් වූ අතර, මුදල් කොමිෂන් සභාව විසින් ඉතා සුපරික්ෂාකාරිව තක්සේරු කර රු.මි. 3 426 ක පරිපූරක ප්‍රතිපාදන මුදලක් නිර්දේශ කර මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අතරම, පළාත් සභා තුනක් මගින් ඉල්ලීම් කරන ලද පරිපූරක වියදම් අයිතම සඳහා වන රු.මි. 658 ක මුදල, මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කිරීම සඳහා සලකා නොබැලූ අතර එම අයිතමයන් බොහොමයක් 2019 මූලික නිර්දේශයන්ට ඇතුළත් කර තිබුණි.

2019 වර්ෂයේ තුන්වන කාර්තුව අවසන් වන විට පුනරාවර්තන වියදම් යටතේ පළාත් සභාවලට පරිපූරක අයවැය ප්‍රතිපාදන ලෙස රු.මි. 10 254 ක මුදලක් මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

## 4. පළාත් කාර්ය මණ්ඩලය සමාලෝචනය

පළාත් සභා සඳහා සේවක සංඛ්‍යාව තක්සේරු කිරීමේ කාර්යය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සහ මුදල් කොමිෂන් සභාව සමඟ එක්ව සිදු කරනු ලබයි. මෙම ක්‍රියාවලියේදී, තුන්වන කාර්තුව තුළ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද රැස්වීම් අටකට මුදල් කොමිෂන් සභාව සහභාගී වූ අතර පළාත් සභාවල හා ඔවුන් යටතේ ඇති සෑම ආයතනයකම සේවක සංඛ්‍යා අවශ්‍යතා සමාලෝචනය කිරීම සහ තක්සේරු කිරීම එහිදී සිදු කරන ලදී.

**5. මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත**

මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත පිළිබඳ කෙටුම්පත් ලේඛනය සමාලෝචනය කරමින් පවතින අතර, 2019 සැප්තැම්බර් 11 වන දින මෙම පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡාවක් නීතිපති දෙපාර්තමේන්තුව සමඟ පවත්වන ලදී. එහිදී නීතිපති දෙපාර්තමේන්තුව විසින් මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පතට ඇතුළත් කළ යුතු කරුණුවල අන්තර්ගතය පිළිබඳ ප්‍රතිපත්තිමය එකඟතාවකට පැමිණෙන ලදී. ඒ අනුව, නීතිපති දෙපාර්තමේන්තුව විසින් යෝජිත කරුණු විධිමත් ආකෘතියකට අනුව සකස් කර නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට යවා ඇත.

**6. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2018**

2018 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව, කාර්යසාධන වාර්තාව සහ ගිණුම් ප්‍රකාශන භාෂා ත්‍රයෙන්ම සකස් කර ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කරන ලදී. 2018 වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ලිපි ලේඛන අතිගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර 2019 අගෝස්තු 06 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සභාගත කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. වාර්ෂික වාර්තාව ඇතුළු අනෙකුත් ලිපි ලේඛන 2019 සැප්තැම්බර් 17 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

**7. මුදල් කොමිෂන් සභා දත්ත පදනම සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS)**

පුනරාවර්තන වියදම් අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා වන කළමනාකරණ තොරතුරු පද්ධතිය අදියර තුනකින් ක්‍රියාත්මක වේ. එනම්, i) මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර ඉදිරිපත් කිරීම, ii) මූලාකෘතිය භාරදීම සහ iii) අවසාන නිමැවුම ලබා දීම වේ. මෙම ක්‍රියාවලියේ පළමු අදියර දෙක දැනටමත් සේවා සපයන ආයතනය විසින් අවසන් කර ඇති අතර තෙවන අදියරෙහි කාර්යයන් ඉදිරියට කරමින් පවතින අතර එය ඉතා ඉක්මනින් අවසන් කිරීමට නියමිතව ඇත.

**8. මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තා**

මුදල් කොමිෂන් සභාවේ කාර්තුමය කාර්යසාධන වාර්තා නියමිත පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඉදිරිපත් කර පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. 2019 ජනවාරි 1 දින සිට 2019 මාර්තු 31 දින දක්වා වූ කාලයට අදාළ කාර්යසාධන වාර්තාව (1 වන කාර්තුමය වාර්තාව) 2019 ජූලි 04 වන දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද අතර 2019 අගෝස්තු 19 වන දින 2 වන කාර්තුමය කාර්යසාධන වාර්තාව ද ව්‍යවස්ථාදායක සභාවට ඉදිරිපත් කරන ලදී.

**9. මුදල් කොමිෂන් සභාවේ ආයතනික විශ්ලේෂණය සහ වැඩ අධ්‍යයනය**

කොමිෂන් සභාවේ මූලිකත්වය සහ ආසියා පදනමේ සහයෝගය ඇතිව, මුදල් කොමිෂන් සභාවේ කාර්යයන් විධිමත් කිරීම සහ කාර්යක්ෂමතාවය හා සඵලදායීතාවය ඉහළ නැංවීමේ අරමුණින් වැඩ අධ්‍යයනයක් සිදු කරනු ලබයි. මෙම අධ්‍යයනය සිදු කරනු ලබන්නේ ආසියා පදනම විසින් පත් කරන ලද උපදේශකයින් දෙදෙනෙකුගේ සහභාගීත්වයෙනි. මෙම උපදේශකයින් විසින් මේ වන විට අතුරු වාර්තාවක් ඉදිරිපත් කර ඇත.

**10. ගරු පළාත් ආණ්ඩුකාරවරුන් සහ ප්‍රධාන ලේකම්වරුන් සමග පැවති සාකච්ඡාව**

ප්‍රාග්ධන වියදම් සඳහා රජය විසින් ලබා දී ඇති ප්‍රතිපාදන හා අක්මුදල් ලබා දීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සියලුම පළාත්වල ගරු ආණ්ඩුකාරවරුන් සහ පළාත් ප්‍රධාන ලේකම්වරු සමග රැස්වීමක් 2019 ජූලි 26 වන දින මුදල් කොමිෂන් සභාවේදී කැඳවනු ලැබීය. මෙම රැස්වීම සඳහා මුදල් කොමිෂන් සභාවේ සභාපති සමඟ තවත් සාමාජිකයෙක්, ලේකම්වරයා ඇතුළු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය ද සහභාගී වූහ. නොවැළැක්විය හැකි තත්වයන් නිසා අනෙකුත් කොමිෂන් සභා සාමාජිකයින්ට මෙම අවස්ථාව සඳහා සහභාගී වීමට නොහැකි විය.

අදාළ බලධාරීන් සමඟ කරුණු සලකා බැලීමේදී ඔවුන්ගේ යෝජනා සහ ඔවුන් විසින් ප්‍රකාශ කරන ලද කරුණු සලකා බැලිය යුතුය යැයි ආණ්ඩුකාරවරු ඒකමතිකව එකඟ වූහ. බලය පවරන ලද සහ සමගාමී වගකීම් යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා පළාත් සභාවලට රජයේ ප්‍රාග්ධන ප්‍රදානය වැඩි කිරීමේ අවශ්‍යතාවය පවතින බවත් අදාළ රේඛීය අමාත්‍යාංශවලට වෙන් කරන ලද අරමුදල්වලින් කොටසක් පළාත් සභා වෙත හරවා යැවීම සිදුවිය යුතු බවත් තවදුරටත් සඳහන් විය.

**11.** **විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

තුන්වන කාර්තුව සඳහා මුදල් කොමිෂන් සභාවේ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීමක් 2019 සැප්තැම්බර් 27 වන දින පවත්වන ලදී.

**12.** **පළාත් විගණන වාර්තාවන් හී අවධාරණය කළයුතු කරුණු**

වයඹ, මධ්‍යම හා උතුරු මැද යන පළාත් සභාවල 2018 මූල්‍ය වර්ෂය සඳහා ජාතික විගණන කාර්යාලයෙන් නිකුත් කරන ලද විගණන වාර්තා තුන්වන කාර්තුවේදී මුදල් කොමිෂන් සභාව වෙත ලැබී ඇත. මෙම විගණන වාර්තා සමාලෝචනය කර විශේෂයෙන් අවධානය යොමුකළ යුතු කරුණු කොමිෂන් සභා රැස්වීමේදී සභාගත කරන ලද අතර එහි නිරීක්ෂණයන් පසු විපරම් කටයුතු සඳහා අදාල පළාත්වල ගරු ආණ්ඩුකාරවරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, අභ්‍යන්තර, ස්වදේශ කටයුතු සහ පළාත් සභා අමාත්‍යාංශය සහ පළාත් පාලන ආයතන වෙත යොමු කරන ලදී.

**13.** **මානව සම්පත් සංවර්ධනය**

**13.1.** **කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය**

මුදල් කොමිෂන් සභාවේ ප්‍රතිපත්තිමය තීරණයක් වන කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය සඳහා ආරාධිත දේශනයන් පවත්වනු ලබයි. මෙම කාර්තුව සඳහා පහත දැක්වෙන ආරාධිත දේශණය පවත්වන ලදී.

| දේශකයාගේ නම | මාතෘකාව | දිනය |
|---|---|---|
| 1. ආචාර්ය වින්දා ආරියරත්න | තුලිත ප්‍රාදේශීය සංවර්ධනය | 2019.09.19 |

**13.2.** **කාර්ය මණ්ඩලය පුහුණු කිරීම්**

**දේශීය පුහුණුවීම්**

තුන්වන කාර්තුව තුළ පහත සඳහන් නිලධාරීන් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වන ලදී.

| නම | මාතෘකාව | දිනය |
|---|---|---|
| 1. එස්. එම්. ආර්. එස්. බණ්ඩාර මයා | OPA ශ්‍රී ලංකා විසින් සංවිධානය කරන ලද SDGs පිළිබඳ වාර්ෂික සමුළුව | 2019.09.18 |
| 2. එස්. ඩී. සී. චන්ද්‍රසිරි මයා | රාජ්‍ය වැටුප් සකස් කිරීමේ පරිගණක වැඩසටහන (Pay Roll) | 2019.09.04 / 2019.09.05 / 2019.09.06 |
| 3. ටී. අබේසේකර මිය<br>චන්ද්‍රා මාලනි මෙය<br>නිමාලි රත්නායක මිය | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද ආර්ථික විද්‍යා පර්යේෂණ පිළිබඳ පුහුණුව | 2019.07.05 - 2019.09.06<br>(දක්වා වූ සෑම සිකුරාදා දිනකම) |
| 4. කේ. ඒ. එම්. ලංකානි මිය | රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි | 2019.07.18 - 2019.07.26 |

**විදේශ පුහුණුවීම්**

| නම | මාතෘකාව හා රට | දිනය |
|---|---|---|
| 1. පී. ආර්. එන්. සුජීව මයා | චීනයේ සංවර්ධන අත්දැකීම් සහ ප්‍රතිසංස්කරණ හා ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සඳහා ඇති අවස්ථා පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 2019.09.02- 2019.10.01 |
| 2. ටී. ජී. සී. මාලනී මෙය<br>ඒ. ඩබ්. කේ. එස්. රණසිංහ මිය | 2019 සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතාව පිළිබඳ අමාත්‍ය වැඩමුළුව - චීනය | 2019.09.18-2019.09.24 |
| 3. වී. මහේන්ද්‍රරාජා මයා | රටවල් අතර ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අයවැයකරණය පිළිබඳ අධ්‍යයන වැඩමුළුව - ගෝව, ඉන්දියාව | 2019.09.11-2019.09.12 |

**14. කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සහ ස්ථාන මාරුවීම්**

2019 වර්ෂයේ තුන්වන කාර්තුවේදී, පහත සඳහන් නිලධාරීන් මුදල් කොමිෂන් සභාව හා සම්බන්ධ විය.

| නම | තනතුර | සම්බන්ධ වූ දිනය |
|---|---|---|
| 1. එස්. කේ. කොතලාවල මිය | ප්‍රධාන ගණකාධිකාරි | 2019.07.02 |
| 2. එස්. ඒ. හංසනී සඳමාලි මෙය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 2019.07.01 |
| 3. ඩී. වී. යූ. ගුණවර්ධන මයා | කාර්යාල සහකාර - අනියම් | 2019.08.01 |

පහත සඳහන් නිලධාරියා මුදල් කොමිෂන් සභාවෙන් ස්ථාන මාරු වීමක් ලබා ගන්නා ලදී.

| නම | තනතුර | ස්ථාන මාරු වූ දිනය |
|---|---|---|
| 1. සුසන්ත රණසිංහ මයා | ප්‍රධාන ගණකාධිකාරි | 2019.07.02 |

මීට අමතරව, අභ්‍යාසලාභී උපාධිධාරීන් 15 දෙනෙකු 2019 අගෝස්තු මස 1 වන දින මුදල් කොමිෂන් සභාවට අනුයුක්ත කරන ලදී.

**15. මාණ්ඩලික අධ්‍යනයන්**

මුදල් කොමිෂන් සභාවේ අනිවාර්ය රාජකාරි ඉටු කිරීමේ දී, එහි කාර්ය මණ්ඩලය විසින් අඛණ්ඩව අධ්‍යයනයන් / පර්යේෂණයන් සිදු කරනු ලැබේ.

| නිලධාරියාගේ නම | සිදු කරන ලද අධ්‍යයනය |
|---|---|
| තුලිත ප්‍රාදේශීය සංවර්ධන දර්ශක පිළිබඳ අධ්‍යයනය (ක්‍රියාත්මක වෙමින් පවතී) | එස්. එම්. ආර්. එස්. බණ්ඩාර මයා - අධ්‍යක්ෂ (සැලසුම්)<br>නිමාලි රත්නායක මිය - සංඛ්‍යාන නිලධාරිනි |
| එක් එක් අංශ සඳහා අරමුදල් වෙන් කිරීම සඳහා තාර්කික දර්ශක සංවර්ධනය කිරීම | එස්. එම්. ආර්. එස්. බණ්ඩාර මයා -අධ්‍යක්ෂ (සැලසුම්)<br>වී. මහේන්ද්‍රරාජා මයා - අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා පර්යේෂණ)<br>නිමාලි රත්නායක මිය - සංඛ්‍යාන නිලධාරිනි |
| භූගෝලීය සංවර්ධන සැලසුම් හා දරිද්‍රතාව පිළිබඳ සම්බන්ධතාවය | නිමාලි රත්නායක මිය - සංඛ්‍යාන නිලධාරිනි |
| සෞඛ්‍ය හා අධ්‍යාපනය පිළිබඳ ආංශික අධ්‍යයන | ටී. අබේසේකර මිය - සහකාර අධ්‍යක්ෂ<br>ඉන්ද්‍රාදේවී මිය - සහකාර පර්යේෂණ නිලධාරිනි |

**16. "Orientation to Results Based Management for Inclusive Social Development" වැඩමුළුව හා උපදේශනය**

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව 2019 ජූලි 9 සිට 12 දක්වා වූ කාලය තුළ "Results Based Management for Inclusive Social Development" පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩමුළුව සඳහා පළාත් සංවර්ධන සැලසුම් අධ්‍යක්ෂකවරයා හා සහකාර පර්යේෂණ නිලධාරියෙක් සහභාගී වූහ.

වැඩමුළුවේදී පහත සඳහන් ඒකක ආවරණය කරන ලදී: ප්‍රතිඵල පදනම් කරගත් කළමනාකරණයේ අවශ්‍යතාවය පිළිබඳ ප්‍රධාන සංකල්ප, ඇතුළත් කිරීම් සඳහා වූ සම්මත රාමුව, සහභාගීත්වය සහ උපායමාර්ගික සැලසුම්කරණය සහ හේතු විශ්ලේෂණය, වෙනස් කිරීමේ න්‍යාය, ප්‍රතිඵල රාමුව සහ මිනුම් රාමුව, ඇතුළත් කිරීම් ක්‍රියාත්මක කිරීම, ප්‍රතිඵල සඳහා අධීක්ෂණය, ප්‍රතිඵල සඳහා වාර්තා කිරීම, ඇගයීම, ප්‍රතිඵල පදනම් කරගත් කළමනාකරණ රාමුව යටතේ ආයතනිකකරණය හා කණ්ඩායම් ක්‍රියාකාරකම්.

**17. සම්මන්ත්‍රණ සහ රැස්වීම් වලට සහභාගී වීම**

- තිරසාරභාවය සඳහා තායිලන්ත සහ ශ්‍රී ලංකා හවුල්කාරිත්වය - සභාපති
- යුරෝපා සංගමය පුළුල් කිරීම: අපේක්ෂාවන් සහ අභියෝගකරුවන් - සභාපති
- ඉන්දියානු සාගර කලාපයේ බල තරඟය: බලපෑම සහ අභිප්‍රාය - සභාපති
- "India's Offensive Defensive Strategy: The New Normal?" - සභාපති
- The Millennium Challenge Corporation Compact Land Grant to Sri Lanka - සභාපති
- තිරසාර ජාතික සංවර්ධනය සඳහා වෘත්තිකයන්ගේ කාර්යභාරය - සභාපති
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය - සභාපති
- ADB අධ්‍යාපන අංශය පිළිබඳ රැස්වීම - සභාපති
- ශ්‍රී ලංකා රජයේ සංවර්ධන උපායමාර්ග සහ ඒවා සඵලදායිව නිශ්චල දේපළ සඳහා උපයෝගී කර ගැනීම - සභාපති
- ශ්‍රී ලංකාවේ බලශක්ති අංශයේ වර්තමාන තත්ත්වය සහ ශ්‍රී ලංකාවේ බලශක්ති කර්මාන්ත නියාමකයාගේ බලය පවරා ගැනීම සඳහා යෝජිත සංශෝධන - සභාපති
- පොලිසියේ  ස්වාධීනත්වය - සභාපති
- සූර්ය බලශක්ති කර්මාන්තයේ නව ප්‍රවණතා සහ ගෘහ භාණ්ඩ හා අභ්‍යන්තර නිමවුම් කර්මාන්ත වල නව ප්‍රවණතා - සභාපති
- සමුද්‍රීය සම්පත් උපයෝගී කර ගැනීම - සභාපති
- ළමා සංවර්ධනය පිළිබඳ වූ වැඩමුළුව - සභාපති සහ ලේකම්
- තිරසාර ජාතික සංවර්ධන වෘත්තිකයන්ගේ කාර්යභාරය පිළිබඳ සම්මන්ත්‍රණය - සභාපති සහ අධ්‍යක්ෂ (PDP)
- පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල පරිපාලනමය කරුණු පිළිබඳ සාකච්ඡාව - ලේකම් සහ සහකාර අධ්‍යක්ෂ (PRNCA)
- පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ අංශ ව්‍යාපෘතිය පිළිබඳ රැස්වීම - ලේකම්
- ප්‍රාදේශීය සංවර්ධන සහය ව්‍යාපෘති පිළිබඳ රැස්වීම - ලේකම්
- දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා වූ මාර්ගෝපදේශ පිළිබඳ සාකච්ඡාව - ලේකම්
- ප්‍රධාන ලේකම්වරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන්  සමඟ සම්මන්ත්‍රණය - ලේකම්
- මූල්‍ය ඇතුළත් කිරීම් පිළිබඳ වූ රැස්වීම - ලේකම්, ප්‍රධාන ගණකාධිකාරී සහ සහකාර අධ්‍යක්ෂ (PDP)
- Meeting on Common Planning Platform - ලේකම්
- ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ගය පිළිබඳ වැඩමුළුව - ලේකම්
- ප්‍රාදේශීය සංවර්ධන සහය ව්‍යාපෘතිය පිළිබඳ රැස්වීම - ලේකම් සහ සංවර්ධන නිලධාරීයකු
- මුදල් කොමිෂන් සභාවෙහි පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම - ලේකම්, සංඛ්‍යාන නිලධාරිණී සහ සංවර්ධන නිලධාරී
- පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - ලේකම්
- ද්විතීයික නගර තිරසාර සංවර්ධනය - ලේකම්
- පනත් කෙටුම්පත ඇගයීම පිළිබඳ සාකච්ඡාව - අධ්‍යක්ෂ (PRP)
- ජනගහන හා නිවාස සංගණනය පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ රැස්වීම - අධ්‍යක්ෂ (PRP)
- Conference on Gender Responsive Budgeting - අධ්‍යක්ෂ (PRP)
- උතුරු පළාතෙහි සංස්කෘතික ඒකකය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවක් දක්වා  උසස් කිරීම පිළිබඳ සාකච්ඡාව - අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ (PRNCA)
- SGPC මාර්ග, මගී සහ ප්‍රවාහන සේවකයින් සඳහා 2019 සිට අයවැය වෙන් කිරීම පිළිබඳ සාකච්ඡාව - අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ (PRNCA)
- ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡාව - අධ්යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ (PRNCA)
- මධ්‍යම, බස්නාහිර, වයඹ සහ උතුරු මැද යන  අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු හී සේවක සංඛ්‍යාව පිළිබඳ සාකච්ඡාව - අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ සහ සංවර්ධන නිලධාරී (PRNCA)
- සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වන ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතාව පිළිබඳ  අමාත්‍ය වැඩමුළුව  2019 - සහකාර අධ්‍යක්ෂ (PDP) සහ අභ්‍යන්තර විගණක

**18. මුදල් කොමිෂන් සභා රැස්වීම්**

- පහත සඳහන් දිනයන්හි කොමිෂන් රැස්වීම් පවත්වන ලදී.
    - 15.08.2019
    - 24.08.2019
- කොමිෂන් සභා අනු කමිටුව සෑම කොමිෂන් සභා රැස්වීමකටම පෙර රැස්විය.
- සතිපතා විධායක නිලධාරීන්ගේ රැස්වීම පැවැත්විය.

**19. කොමිෂන් සභා රැස්වීම්වලදී ගනු ලැබූ වැදගත් තීරණ**

- පළාත් ප්‍රාග්ධනය සහ පුනරාවර්තන වියදම් සඳහා නිර්දේශ අනුමත කිරීම - 2020
- ප්‍රාග්ධන වියදම් බෙදා හැරීම සඳහා සංයුක්ත දර්ශකයේ දරිද්‍රතා අනුපාතය වෙනුවට දරිද්‍රතා රේඛාව යටතේ ජනගහනය භාවිතා කිරීම.
- පළාත් සභා විසින් ඔවුන්ගේ  ආදායම් වැඩිකර ගැනීම සඳහා, මුදල් කොමිෂන් සභාවේ සහාය ඇතිව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන ආදායම සහ ඒකාබද්ධ පර්යේෂණ වැඩි කර ගැනීමේ මාර්ග සහ ක්‍රම සොයා ගත යුතුය.
- 2020 සිට පළාත් සභා විසින් ඔවුන්ගේ අරමුදල් ඉල්ලීම ඉදිරිපත් කරන විට ආදායම් වැඩි දියුණු කිරීමේ යෝජනාවන් කැඳවිය යුතුය

**20. අනු කමිටු රැස්වීම්වලදී ගනු ලැබූ වැදගත් තීරණ**

- අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා අංශ රැස්වීම සංවිධානය කිරීම
- ඒකාබද්ධ සැලසුම් පද්ධතිය පිළිබඳ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ රැස්වීම
- මුදල් කොමිෂන් සභාවේ ගුණාත්මක  සංවර්ධනය
- මානව සම්පත් සැලැස්ම සකස් කිරීම අවසන් කිරීම
- අරමුදල් වෙන් කිරීම සඳහා එක් එක් අංශ සඳහා තාර්කික දර්ශක සංවර්ධනය කිරීම
- මූල්‍ය ඇතුළත් කිරීම් සම්බන්ධ රැස්වීම
- පළාත් හා සම්බන්ධව රේඛීය අමාත්‍යාංශ විසින් දරනු ලබන වියදම් තීරණය කිරීම